# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 10.00 යි.

# 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වැනි දින]

එල්. ඩී.—ඕ. 19/2011

**බදු අභියාචනා කොමිෂන් සභාවක් සංස්ථාපනය කිරීම සඳහා ද, එම කොමිෂන් සභාවේ බලතල සහ එම කොමිෂන් සභාව විසින් අභියාචනා විභාග කොට අවසන් කිරීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් බදු, ගාස්තු හෝ අයකිරීම් පැනවීම හා අදාළ කාරණා සම්බන්ධයෙන් වන සියලු අභියාචනා විභාග කිරීමේ වගකීම පවරා ඇති බදු අභියාචනා කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. බදු අභියාචනා කොමිෂන් සභාව පිහිටුවීම සහ එහි සංයුතිය.

(2) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් බදුකරණය, මූල්‍ය සහ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහිත සහ ප්‍රසිද්ධියක් උසුලන විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණ විනිශ්චයකරුවන් අතුරින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුට වැඩි නොවන සංඛ්‍යාවකින් කොමිෂන් සභාව සමන්විත විය යුතු ය. අමාත්‍යවරයා විසින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කළ යුතු ය.

(3) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකුම අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

**3.** මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්වරයකු සිටිය යුතු ය. කොමිෂන් සභාවේ ලේකම්වරයා.

**4.** (1) අමාත්‍යවරයා විසින් (මෙහි මින්මතු "මූල මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙම පනත යටතේ වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම, කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස කොමිෂන් සභාවට සහාය වීමේ කාර්යය සඳහා නීතිය පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධියක් උසුලන තැනැත්තන් දසදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වන නීති උපදේශක මූල මණ්ඩලයක් පත් කළ යුතු ය. නීති උපදේශක මූල මණ්ඩලය.

2—PL 005600—3,350 (2011/03)

(2) කොමිෂන් සභාවේ නඩු විභාග සඳහා සහභාගි වීමට සහ එම කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා අභියාචනා නඩු කටයුතු සහ යම් විමර්ශණයක් පවතී නම් එම කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අමාත්‍යවරයා විසින් මූල මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නම් කළ යුතු ය.

කොමිෂන් සභාවේ සහ මූල මණ්ඩලයේ සාමාජිකයන්ගේ රැස්වීම්.

**5.** සභාපතිවරයාගේ ඉල්ලීම මත, කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ සහ මූල මණ්ඩලයේ සියලු සාමාජිකයන්ගේ රැස්වීමක් මසකට එක් වතාවක්වත් කැඳවිය යුතු ය. එවැනි රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

කොමිෂන් සභාවේ සහ මූල මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**6.** කොමිෂන් සභාවේ සහ මූල මණ්ඩලයේ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රඥප්තියක් යටතේ ලබා දෙන ලද තීරණයකට එරෙහිව කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිය.

**7.** (1) මෙම පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රඥප්තියක විධිවිධානයක් යටතේ යම් බද්දක්, ගාස්තුවක් හෝ අයකිරීමක් පැනවීම හා අදාළ යම් කාරණාවක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා විසින් ලබාදෙනු ලබන යම් තීරණයකින් අතෘප්තියට පත් වන යම් තැනැත්තකුට මෙහි මින්මතු දක්වා ඇති විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකි ය :

එසේ වුව ද, කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරනු ලබන සෑම තැනැත්තකුට ම අභියාචනය කරනු ලබන අවස්ථාවේ දී එකී ප්‍රඥප්තිය යටතේ එම තැනැත්තා විසින් ගෙවිය යුතු බවට දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා විසින් තක්සේරු කර ඇති සහ එම තක්සේරුව අභියාචනයේ විෂයය කාරණය වී ඇති මුදලින් සියයට විසි පහකට සමාන මුදලක් කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා විවෘත කරනු ලබන සහ පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට ගෙවන ලෙස හෝ ඒ හා සමාන මුදල් ප්‍රමාණයක බැංකු ඇපකරයක් තබන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධානවලට අනුකූලව අභියාචනය කිරීමේ අයිතිය පැන නැගී ඇති යම් තැනැත්තකු, එම තීරණයට එරෙහිව තමන් කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමට අපේක්ෂා කරනු ලබන බව පිළිබඳ කාරණය, අදාළ නීතී යටතේ ඔහු වෙත එම තීරණය දැනුම් දීමෙන් දින තිහක් ඇතුළත කොමිෂන් සභාව වෙත දැන්විය යුතු ය. ඔහුගේ බලයලත් නියෝජිතයකු සිටී නම් එම තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළුව එම තීරණය පිළිබඳ සියලු විස්තර ඔහු විසින් එම දැන්වීමේ සඳහන් කළ යුතු ය.

(3) එවැනි යම් තීරණයකට එරෙහිව කොමිෂන් සභාවට අභියාචනය කිරීමට අපේක්ෂා කරනු ලබන බවට යම් අතෘප්තියට පත් තැනැත්තකු (2) වන උපවගන්තියේ විධිවිධානයන්ට අනුකූලව කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති අවස්ථාවක කොමිෂන් සභාව විසින් එම දැන්වීමේ පිටපතක් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම තැනැත්තා අභියාචනය කරනු ලබන ඔහුගේ එම තීරණයට හේතු එම දැන්වීම ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත කොමිෂන් සභාව වෙත සහ අතෘප්තියට පත් තැනැත්තා වෙත සහ ඔහුගේ බලයලත් නියෝජිත වෙත ලිඛිතව ලබාදෙන ලෙස නියම කළ යුතු ය.

(4) මෙම පනත යටතේ අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ආකාරය සහ ආකෘතිය සහ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ඇත්නම් ඒවා සහ අභියාචනයක් ඉදිරිපත් කළ යුතු කාලසීමාව නියම කරනු ලැබ ඇති පරිදි විය යුතු ය.

අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා වන කාර්ය පටිපාටිය.

**8.** අතෘප්තියට පත් තැනැත්තකුට, ඔහු කොමසාරිස්-ජනරාල්වරයා විසින් ලබාදෙන ලද හේතු පිළිබඳව සෑහීමට පත් නොවන්නේ නම් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එවිට, කොමිෂන් සභාව විසින් ඒ වෙනුවෙන් සාදනු ලැබිය හැකි යම් රීතීන්ට අනුකූලව එම අභියාචනය පිළිබඳව විභාග කොට තීරණය කළ යුතු ය.

අභියාචනා විභාග කිරීම.

**9.** (1) අභියාචනයක් ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අභියාචනය විභාග කිරීම සඳහා යම් දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතු අතර අභියාචක හා කොමසාරිස්-ජනරාල්වරයා යන දෙපාර්ශවයට දින හතලිස් දෙකක දැනුම් දීමක් ඒ පිළිබඳව ලබාදිය යුතු ය.

(2) කොමසාරිස්-ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ප්‍රඥප්තිවල විධිවිධානවල උද්ධෘත සහ එම ප්‍රඥප්ති යටතේ පවත්වාගෙන යනු ලබන සාක්ෂි පිළිබඳ වාර්තාවේ පිටපතක් ද කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලබන දිනයේ දී සෑම අභියාචකයකු ම තමා විසින්ම හෝ බලයලත් නියෝජිතයකු මගින් ඊට සහභාගි විය යුතු ය :

එසේ වුව ද, අභියාචනය විභාග කරනු ලබන විට දී, අභියාචකගේ බලයලත් නියෝජිත පෙනී සිටින අවස්ථාවක, කොමිෂන් සභාව විසින් අභියාචකට තමන් විසින් ම ඊට සහභාගිවීමට හැකි වන පරිදි සුදුසු යයි සිතනු ලබන යම් කාලයකට අභියාචනය විභාග කිරීම කල් තැබිය හැකි ය.

(4) අභියාචනය කරනු ලැබූ තක්සේරුව සිදු කරන ලද තක්සේරුකරු හෝ කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද යම් තැනැත්තකු එම අභියාචනය විභාග කරනු ලබන කොමිෂන් සභාවේ විභාගය සඳහා කොමසාරිස්-ජනරාල්වරයාගේ තීරණයට සහාය වීම පිණිස සහභාගි විය යුතු ය.

(5) පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ප්‍රඥප්තිවලට අනුව කොමසාරිස්-ජනරාල්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව අධිකතර වන බව හෝ සාවද්‍ය බව ඔප්පු කිරීමේ භාරය අභියාචක වෙත පැවරිය යුතු ය.

(6) සියලුම අභියාචනා රහසිගතව විභාග කළ යුතු ය.

(7) යම් අභියාචනයක් සම්බන්ධයෙන් සාක්ෂි ලබාදීමට හැකියාවක් ඇති බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් තැනැත්තකු යම් විභාගයකට කැඳවීමේ බලය සභාව සතුව පැවතිය යුතු අතර, එම තැනැත්තාව දිවුරුමක් මත හෝ අන්‍යාකාරයෙන් සාක්ෂිකරුවකු වශයෙන් පරීක්ෂා කළ හැකි ය. එසේ සහභාගි වන යම් තැනැත්තකුට එසේ සහභාගිවීමේ දී ඔහු විසින් දරන ලද යම් සාධාරණ වියදම් ගෙවනු ලැබීමට කොමිෂන් සභාව විසින් අවකාශ ලබාදිය යුතු ය.

(8) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් නියමයක් මත මිස, අභියාචක විසින් එම විභාගයේ දී ඊට පෙර කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් නොකරන ලද කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඊට පෙර ඉදිරිපත් නොකරන ලද යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට හෝ කොමසාරිස්-ජනරාල්වරයා ඉදිරියේ පැවති විභාගයේ දී දැනටමත් වාර්තාගත කර ඇති යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට හෝ අවකාශ ලබා නොදිය යුතු ය.

(9) අභියාචනය විභාග කිරීමේ දී කොමිෂන් සභාව විසින්, වාචිකව හෝ ලේඛන වශයෙන් ඉදිරිපත් කරන ලද යම් සාක්ෂි පිළිගැනීම

හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුකල හැකි අතර, සාක්ෂිවල ආවේශ්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ විධිවිධාන එම සාක්ෂි සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(10) කොමිෂන් සභාව විසින් සාක්ෂි විභාග කිරීමෙන් පසුව, කොමසාරිස්-ජනරාල්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව අභියාචනයේ දී, අවස්ථාවෝචිත පරිදි ස්ථිර කිරීම, අඩුකිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම සිදු කළ යුතු ය ; ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය සමග කොමසාරිස්-ජනරාල්වරයා වෙත අදාළ කාරණය යොමු කළ හැකි ය. කොමිෂන් සභාව විසින් එසේ යම් කාරණයක් යොමු කල අවස්ථාවක, කොමසාරිස්-ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ තීරණයේ සඳහන් මුදල් ප්‍රමාණයට අනුකූල වන පරිදි තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතු ය. කොමිෂන් සභාවේ තීරණය අභියාචකට සහ කොමසාරිස් ජනරාල්වරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

**10.** කොමිෂන් සභාව විසින්, එය වෙත ලැබෙන සියලු අභියාචනා විභාග කළ යුතු අතර, ඒවා සම්බන්ධයෙන් වන එහි තීරණය අභියාචනය විභාග කිරීම ආරම්භ කළ දින සිට දින එකසිය අසූවක් ඇතුළත ලබාදිය යුතු ය :

කොමිෂන් සභාව විසින් අභියාචනා පිළිබඳ තීරණය කිරීම.

එසේ වුව ද, අදාළ මණ්ඩලය හෝ මෙම පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ප්‍රඥප්තීන්හි විධිවිධානවලට අනුව සමාලෝචන මණ්ඩල ඉදිරියේ විභාග වෙමින් පවත්නා සියලු අභියාචනා, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද කොමිෂන් සභාව විසින්, එම අභියාචනා එසේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ දින සිට දින එකසිය අසූවක් ඇතුළත දී ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා දිය යුතු ය.

**11.** 9 වන වගන්තියේ (10) වන උපවගන්තිය යටතේ මෙම පනතේ නියමයන්ට අනුව ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් වන යම් තක්සේරුවක් කොමිෂන් සභාව විසින් අඩුකිරීම හෝ අවලංගු කිරීම සිදු නොකරනු ලබන අවස්ථාවක තක්සේරු කරන ලද මුදලට අමතරව, තක්සේරුව මගින් පනවනු ලැබූ සහ ඒ සමග අයකර ගනු ලබන බදු මුදලට එකතු විය යුතු රුපියල් පන්දහසක් නොඉක්මවන මුදලක්, ගාස්තු වශයෙන් ගෙවන ලෙස කොමිෂන් සභාව විසින් අභියාචකට නියම කළ හැකි ය.

කොමිෂන් සභාව විසින් තක්සේරුව අඩුකිරීම හෝ අවලංගු කිරීම සිදු නොකරන විට තක්සේරුව සමග ගාස්තු අයකරගත යුතු බව.

කිසිදු නඩු පැවරීමක් හෝ නීති කෘත්‍යයක් ආරම්භ කිරීමක් සිදු නොකළ යුතු බව.

**12.** මෙම පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධාන යටතේ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් සිදු කරනු ලබන යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා කිසිදු නඩු පැවරීමක් හෝ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම සිදු නොකළ යුතු ය.

ඉවත් කිරීම.

**13.** මෙම පනතේ උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධානවල, උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වගන්ති හෝ කොටස් එම උපලේඛනයේ III වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට සහ ආකාරයට මෙයින් සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

| | I වන තීරුව | II වන තීරුව | III වන තීරුව |
|---|---|---|---|
| | ප්‍රඥප්තිවල නම් | සංශෝධනය කරනු ලබන වගන්ති හෝ කොටස් | අදාළ සංශෝධනය |
| 1 | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | 166, 167, 168, 169 වගන්ති | 166 වන වගන්තිය, 167 වන වගන්තිය, 168 වන වගන්තිය සහ 169 වන වගන්ති ඉවත් කිරීමෙන් දේශීය ආදායම් පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ |
| 2 | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 35, 35(1අ) 36 වගන්ති | 35, 35(1අ) සහ 36 වගන්ති ඉවත් කිරීමෙන් එකතු කළ අගය මත බදු පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ |
| 3 | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 8 වන වගන්තිය | "අභියාචනා සම්බන්ධයෙන් අදාළ XXIII වන අධිකාරය" යන වචන සහ ඉලක්කම් ඉවත් කිරීමෙන් ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 8 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ |
| 4 | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | 11 වන වගන්තිය | "අභියාචන" යන වචනය ඉවත් කිරීමෙන් ආර්ථික සේවා ගාස්තු පනතේ 11 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.